ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්ः 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියः www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016/09/21 |

## 2016 අගෝස්තු මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 ජූලි මාසයේ දී වාර්තා කළ සියයට 5.8 හි සිට 2016 අගෝස්තු මාසයේ දී සියයට 4.5 දක්වා පහළ ගියේය. 2016 අගෝස්තු මස ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි ආහාර කාණ්ඩය මෙන්ම ආහාර නොවන කාණ්ඩය ද දායක විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2016 ජූලි මස වාර්තා වූ සියයට 3.4 හි සිට 2016 අගෝස්තු මස දී සියයට 3.6 දක්වා ඉහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සැලකූ විට 2016 ජූලි මාසයේ වාර්තා වූ දර්ශක අංක 115.2 සිට 2016 අගෝස්තු මාසයේ දී දර්ශක අංක 113.3 දක්වා සියයට 1.6 ක අඩුවීමක් වාර්තා වේ. මෙම අඩුවීම සඳහා ආහාර කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. එළවළු, අමුමිරිස්, සීනි, පොල්, වියළි හාල්මැස්සන්, සහල්, පරිප්පු සහ රතු ළූණු මිල ගණන් මාසය තුළ දී පහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ සෞඛ්‍ය; සන්නිවේදන; සහ විනෝදාත්මක හා සංස්කෘතික යන උපකාණ්ඩයන්හි මිල ගණන් 2016 අගෝස්තු මාසය තුළ දී පහළ ගියේය. රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; ප්‍රවාහන; ආපනශාලා හා හෝටල් සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩවල මිල ගණන් 2016 අගෝස්තු මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර මධ්‍යසාර පාන හා දුම්කොළ උප කාණ්ඩයෙහි මිල ගණන් 2016 අගෝස්තු මාසය තුළ දී ඉහළ ගියේය. කෙසේ වුවද, අධ්‍යාපන උප කාණ්ඩය මාසය තුළ දී නොවෙනස්ව පැවතුණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි.ද. මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත, 2016 ජූලි මස පැවති සියයට 6.8 සිට 2016 අගෝස්තු මස වන විට සියයට 6.0 දක්වා

පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය ජා.පා.මි.ද. මූලික උද්ධමනය 2016 ජූලි මස වාර්තා වූ සියයට 5.5 හි සිට 2016 අගෝස්තු මස වන විට සියයට 5.6 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.



## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම
## පදනම : 2013 = 100

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජුනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| 2016 | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 | 2.6 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 | 2.7 |
| | ජුනි | 116.1 | 2.1 | 6.4 | 3.1 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 | 3.4 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 | 3.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව